ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ 38වන අධ්‍යක්ෂ මණ්ඩල හමුව බෙන්තොට දී</u>**

ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ 38වන අධ්‍යක්ෂ මණ්ඩල හමුව 2023 මාර්තු 3 වන දින බෙන්තොට දී පැවැත්විණ. මෙම හමුව ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතගේ සහ ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතාගේ සම සභාපතිත්වයෙන් පැවැත්විණ. පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වන ගෝපලස්වාමි පර්තසාරති සහ බර්නාඩ් ගුණතිලක යන මහත්වරු ද මෙම හමුවට සහභාගී වූහ.

2. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම (ISLF) ආර්ථික, විද්‍යා, අධ්‍යාපනික, තාක්ෂණික සහ සංස්කෘතික සහයෝගීතාවය ඉහළ නැංවීම තුළින් ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් කිරීමේ සහ දෙරට ජනතාව අතර අවබෝධය ඉහළ නැංවීමේ අරමුණින් 1998 වසරේ දෙසැම්බර් 28 වන දින ඉන්දියානු සහ ශ්‍රී ලංකා රජයන් අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් පිහිටුවන ලදී.

3. පදනම විසින් කලාව සහ සංස්කෘතිය, අධ්‍යාපනය, කෘෂිකර්මය, පර්යේෂණ, විද්‍යා සහ තාක්ෂණය, සෞඛ්‍ය, සමාජ කටයුතු, සංවර්ධන අධ්‍යයන සහ සංචාරක කර්මාන්තය යන ක්ෂේත්‍රවලට අදාළ ව්‍යාපෘති යෝජනා භාර ගනු ලබයි. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම මේ දක්වා ව්‍යාපෘති 580කට වැඩි ගණනකට සහය ලබා දී ඇත. පදනමේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් දෙරට රජයන් විසින් ද්විපාර්ශ්වික සබඳතාවය සහ ජනතාව අතර සබඳතා ශක්තිමත් කිරීම සඳහා ගන්නා ප්‍රයත්නයන් තවත් සවිමත් කරයි. මෙම වසරේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සඳහා ව්‍යාපෘති යෝජනා 98ක් ඉදිරිපත්ව තිබිණ. සහයෝගය ලබා දීම සඳහා අනුමත කරන ලද ව්‍යාපෘතීන් ඉදිරි මාසවලදී ක්‍රියාවට නැංවෙනු ඇත.

***

කොළඹ
2023 මාර්තු 09